# භූගෝල විද්‍යාව - 11 ශ්‍රේණිය
# පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01) හතරකි | 11) ඇමසන් | 21) 2 | 31) 3 |
| 02) ක්ෂය නොවන | 12) ශ්‍රී ලංකාව | 22) 3 | 32) 3 |
| 03) කුරුණෑගල | 13) ඉන්දියාව | 23) 3 | 33) 1 |
| 04) 1000 | 14) ආග්නේය | 24) 4 | 34) 1 |
| 05) ජෛව ස්කන්ධ | 15) නයිස් | 25) 3 | 35) 4 |
| 06) වැ | 16) බැගියෝ | 26) 4 | 36) 1 |
| 07) නි | 17) චීනය | 27) 4 | 37) 1 |
| 08) වැ | 18) සමෝච්ච රේඛා | 28) 2 | 38) 2 |
| 09) වැ | 19) 12 | 29) 2 | 39) 4 |
| 10) නි | 20) 2 | 30) 2 | 40) 3 |

(1) අ) 1) අභ්‍යන්තර තැනිතලාවටය.

2) ගලකි/පාෂාණ උද්ගතයකි

3) හැඩපලු ගංගාවකි

4) ජාලාකාර ජල වහනය

5) වනාන්තර වලින් වැසී ඇත

6) දිස්ත්‍රික් මායිම/පළාත් මායිම/උප දිසාපති කොට්ඨාසය

7) වී වගාව,ගෙවතු වගාව,හේන් වගාව

8) වගාවන්/මහාමාර්ග/වැව් /අඩිපාර/පරිපාලන මායිම්/තැපැල් කාර්යාල /පාසල්/පන්සල් පාෂාණ උද්ගත/වනාන්තර/කඳු/කඳු පන්ති /බෑවුම් /ගංගා

ලෝක සිතියම

(1) ආ)

1) ඇමසන් -A
2) දකුණු කොරියාව-1
3) M
4) R
5) E

ලංකාසිතියම

(1) ඉ)

1) C-පුල්මුඩේ
2) R-මාතලේ
3) E
4) H
5) 2

(2) 1) A -නයිට්‍රජන් ($N_2$)

B-ඔක්සිජන් ($O_2$)

2)වායු වර්ග වලින් වැඩි කොටසක් අන්තර්ගත වීම.,ජෛවගෝලයේ පැවැත්මට ඉතා වැදගත් වේ,සියලුම කාලගුණික සංසිද්ධි මෙම ස්ථරයේ හටගනී,උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් පහල බසී. (පතන සීඝ්‍රතාව) , පෘථිවි පෘෂ්ඨය සිට 8-12km ක් පමන ඉහලට විහිදේ ,සාමාන්‍ය ගුවන් යානා මෙහි ඉහල සීමාව ආසන්නයේ ගමන් කරයි

3)ජෛවගෝලයේ තුල්‍යතාව බිඳදමයි(රසායනික චක්‍රවලට බාධා ඇති වේ),සැලසුමකින් තොරව ජෛවගෝලිය සංරචක පරිහරණය කරයි,කොරල් පර කැඩීම නිසා කොරල් වාස භූමි විනාශ වීම හා මුහුදු ජීවීන්ගේ පැවැත්මට බාධා ඇති වේ,වෙරළ ඛාදනය වේ,වනාන්තර විනාශ වේ,මතුපිට පස සේදී යාම,පස නිසරු වීම,කෘෂිකර්මය සඳහා පස සකස් කිරීම හා කෘෂි රසායන භාවිතය ,පසේ සංයුතිය වෙනස් වී පාංශු ජීවීන් වද වේ

(3) 1) කළුතර , රත්නපුරය , කෑගල්ල , ගම්පහ , ගාල්ල

2) වෙනත් රටවලින් එල්ල වන තරගය,නිෂ්පාදන වියදම ඉහළ වීම,ආදේශන වලින් එල්ල වන තරගය,රබර් ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම,කිරි කපන්නන්ගේ හිගය,නියමිත මිලක් නොලැබීම හා මිල උච්චාවචනය,බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න අඩු වීම,දේශගුනික හා කාලගුණික සාධක

3) ප්‍රාදේශීය සංවර්ධනයට ඉවහල් වේ,රැකියා නියුක්තිය වැඩි විම හා ජනතාවගේ ජීවන තත්වය ඉහල යාම (රැකියා උත්පදනය),මෙරටට අවශ්‍ය භාණ්ඩ නිපදවීම මගින් ඒවා ආනයනය කිරීමට යන මුදල් ඉතිරිවීම,නිමි භාණ්ඩ අපනයනයෙන් වැඩි විදේශ විනිමය ප්‍රමානයක් ඉපැයීමට හැකි වීම

(4) 1) ඛනිජ තෙල් / පෙට්‍රෝලියම් / ගල් අඟුරු / තාප

2) පිරිවැය අධික වීම,ඛනිජ තෙල් ආනයනයට විශාල මුදලක් වැය වීම,ඇතැම් ඛනිජ සම්පත් ක්ෂය වීමේ අවධානම,බලශක්ති පරිහරනයේ දී නාස්තිය හා අපතේ යාම,පරිසර දූෂණය,ස්වාභාවික ආපදා වලින් හානි සිදු වීම,සුලං සූර්ය ශක්තිය වැනි ඇතැම් බල ශක්ති සම්පත් පාරිසරික සාධක මත තිරණය වීම,ඉල්ලුමට සරිලන සැපයුම දීමට නොහැකි වීම

3) පරිසර හානි අවම වීම,වැඩිවන ඉල්ලුම සැපයීම පහසු වීම,විදේශ විනිමය ඉතිරි කර ගත හැකි වීම,ඉතිරිවන මුදල් වෙනත් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය හැකි වීම,තිරසර පැවැත්මට දායක වීම,අනාගතය සඳහා සම්පත් ඉතිරි විම,ස්වාභාවික උපද්‍රව හා දේශගුණ විපර්‍යාස වලින් එල්ල වන බලපෑම් අවම කරගත හැකි වීම

(5) 1) පුනරුදයෙන් පසුව හටගත් දේශ ගවේශන වෙළඳාම ධීවර හා යුධ කටයුතු සඳහා නැව් වලට ඉල්ලුම වැඩි වීම,නිෂ්පාදනය සඳහා අවශ්‍ය දැව හා වානේ පහසුවෙන් ලබා ගත හැකි වීම,නැව් තටාක සෑදීමට අවශ්‍ය කඩතොලු සහිත වෙරළ ප්‍රදේශ තිබීම,රාජ්‍ය අනුග්‍රහය

2) සීග්‍රයෙන් වෙනස් වන කර්මාන්තයක් වීම,අධි සුඛෝපභෝගී රථ වාහන නිෂ්පාදනය කිරීම,ගොඩ මඩ දිය පොදුවේ ධාවනය කල හැකි නිෂ්පාදන එලි දැක්වීම,පරිසර හිතකාමී වාහන නිෂ්පාදනය ,2020න් පසුව ජපානය සැහැල්ලු වාහන දෙමුහුන් වාහන(Hybrid)වැඩි වශයෙන් නිෂ්පාදනයට සැලසුම කිරීම,ප්‍රමාණයෙන් කුඩා වාහන නිපද වීම

3) ගැටළු - විද්‍යුත් නිෂ්පාදන බොහෝ විට ආනයන උපාංග මත රදා පැවතීම,තාක්ෂණය වේගයෙන් වෙනස් වීම නිසා විද්‍යුත් උපකරන විශාල ප්‍රමානයක් කෙටි කාලයකදී යල් පැන ගිය භාණ්ඩ බවට පත් වීම,පරිසර දූෂණය ,ජංගම දුරකථන වැනි විද්‍යුත් උපකරණ නිරන්තර භාවිතයෙන් සෞඛ්‍ය ගැටළු ඇති වීම,සංස්කෘතික ගැටළු ඇති වීම

ප්‍රවණතා - කර්මාන්ත අශ්‍රිත වක්‍ර හා ඍජු රැකියා අවස්ථා බිහි වීම ,අවශ්‍ය විශේෂඥ ශ්‍රමිකයන් බිහි කරන උසස් අධ්‍යාපන ආයතන හා පාසල් විෂයමාලා සකස් වීම,විද්‍යුත් උපකරණ අලුත් වැඩිය හා සේවා මධ්‍යස්ථාන බහුලව ව්‍යාප්ත වීම

(6) 1) නූතන මිනුම් - මානුෂ පීඩක දර්ශකය,මානුෂ සංවර්ධක දර්ශකය(ය.ශ.ෂ),මානුෂ දරිද්‍රතා දර්ශකය (H.P.I) ,භෞතික ජීවන තත්ව දර්ශකය(P.Q.L.I),

පැරණි මිනුම් - දල ජාතික නිෂ්පාදිතය,මූර්ත දල ජාතික නිෂ්පාදිතය,දල ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය

2) විද්‍යාගාර තාක්ෂණ පහසුකම් ලබා දීම,විෂය මාලාවට තාක්ෂණික විෂය ක්ෂේත්‍ර හදුන්වා දීම,වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුලුල් කිරීම,නොවිධිමත් අධ්‍යාපන අවස්ථා ඇති කිරීම

3) රටේ අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා වැඩි දියුණු වීම, අධ්‍යාපනය සඳහා නව මං පෙත් හෙළිකර දීම,ඍජු හා වක්‍ර රැකියා අවස්ථාවන් ඇති වීම,සාමාන්‍ය ජනතාවගේ දැනුම පුලුල් කර ගැනීම සහ සේවා අවශ්‍යතා සපුරා ගැනීමේ අවස්ථා පුලුල් වීම, ආපදා අවස්ථා වලදී කඩිනමින් දායක වීමේ අවස්ථා සැලසීම,විද්‍යුත් මූල්‍ය සේවාවන් මගින් ගනුදෙනු ඉක්මන් වීම හා සුරක්ෂිත වීම

(7) 1) නැගෙනහිර ආසියාව,දකුණු හා අග්නිදිග ආසියාව ,වයඹ දිග යුරෝපය,ඇමරිකාවේ ඊසාන දිග වෙරළබඩ කලාපය

2) භෞතික සාධක - දේශගුනය ,භූ විෂමතාව,ජලවහනය

මානුෂ සාධක - විවිධ කර්මාන්ත ස්ථාන ගත වීම,නාගරීකරණය ,වෙළඳ මධ්‍යස්ථාන,වරාය පිහිටීම,යටිතල පහසුකම්,විවිධ සේවා ඒකරාශී වීම,පරිපාලන සේවා ස්ථාන ගත වීම

3) අධි ජන සංඛ්‍යාවක් ඒකරාශී වීමට හේතු- දිවයිනේ ප්‍රධනතම වාණිජ කටයුතු ඒකරාශී වී තිබීම,දිවයිනේ පරිපාලන කටයුතු වල ජේන්ද්‍රස්ථානය වීම,අධ්‍යාපන කටයුතු හා සේවා ඒකරාශී වීම,යටිතල පහසුකම් බහුල වීම,කටුනායක ,බියගම නිදහස් වෙළඳ කලාප වලට සංක්‍රමණය හා පහසුවෙන් කොළඹට ලගා විය හැකි විම,දියුණු නගර රැසක් පිහිටා තිබීම

ගැටලු- සේවා සැපයීමේ දුෂ්කරතා,සෞඛ්‍ය ගැටලු,කැළි කසල බැහැර කිරීමේ ගැටලු,ඉඩම් හිගය,ඉඩම් කැබලි වීම,ඉඩම් මිල අධික වීම,නිවාස ගැටලු,යටිතල පහසුකම් පිළිබඳ ගැටලු,පරිසර දූෂණය ,මාර්ග තදබදය ,සමාජ විරෝධී ක්‍රියා

(8) 1) ජීව විද්‍යාත්මක උපද්‍රව - වසංගත රෝග ,ලැව් ගිනි,ශාක හෝ සතුන් මහා පරිමාණෙන් වද වීම

දේශගුනික උපද්‍රව - සුලිසුළං,අකුණු සැර,ජල ගැලීම්,නියඟ ,ලැව්ගිනි

2) A) ජල ගැලීම්

B) නියඟ

C) නාය යාම්

3) තීව්‍ර ජල හිගය ,කෘෂි බිම් විනාශ වීම,පස නිසරු වීම,ජෛව විවිධත්වය බිඳ වැටීම,වෘක්ෂලතා වැස්මට හානි පැමිණීම,ජල විදුලිය උත්පාදනයට බාධා ඇති වීම,රෝග සහ සාගතයෙන් සතුන් හා මිනිස්ජීවිත පීඩාවට පත් වීම